# ගෙවතු වගාව ගැන

ඩබ්ලිව්. කේ. පී. පෙරේරා මහත්මිය

පුරාණ ගෙවතු සියල්ලෙන් සපිරුනු ඒවා බැව් අපි අසා ඇත්තෙමු. මෙවැනි ගෙවතු මෙකල සකස් කර ගැනීම මදක් අපහසු කාර්යයක් වී ඇත. මීට හේතු කිපයකි. විවේකය අඩු බව හා ඉඩම් සීමාවීම මීට ප්‍රධාන හේතු සේ දැක්විය හැක. එම පැරණි ගෙවතු තුල සත්ව පාලනය ද කළ බවට සාධක එමට තිබේ. මෙමඟින් බීමට පෝෂණීය කිරි මෙන්ම වගාවන් සඳහා අවශ්‍ය පොහොර ද ලැබුනි. මෙකලද බොහෝ අය තම තමන් පදිංචි ස්ථානයන්හි ඉඩපහසු කම් ඇති ප්‍රමාණයන් අනුව භූමියේ පාත්ති මත හෝ ගෙදරදොර පෝච්චි හෝ ඉවත ලන භාජන තුල පැල වර්ග වගා කරත්. මෙලෙස පැලෑටි වැවීම ගෙවතු වගාව වශයෙන් හැඳින්විය හැක.

දෙවන ලෝක යුද සමය තුල ආහාර හිඟව පැවති අවධියේ සැම දෙනාම ගෙවතු වගා වශයෙන් ආහාර බෝග වගා කර තිබුණි. මෙම ගෙවතු වගා එකල හැඳින්වූයේ 'වික්ටරි ගාර්ඩන්ස්' යනුවෙනි. එය 'ජයබිම' යනුවෙන් හැඳින්වීම නිවරද යයි සිතමි. යුද්ධයෙන් දිනීම මෙන්ම කුසගිනි නිවීම වැදගත් සේ සළකා මෙසේ නම් කෙරුවාට සැක නැත. කුසගිනි නිවීමෙන් තොරව ජය ලැබීමට උගහට බැවින්, අපට ජන ජීවිතයට '' වවන්නෝ දිනන්නෝ '' යන උපහැරන පවා එක්ව ඇත.

නැවුම්ව නෙලාගත් අළුත් එළවළු ලබාගැනීම මෙකල දුෂ්කර කාර්යයකි. මෙම තරහකාරි බවෙන් තොරව පිරිසිදු එළවළු ප්‍රමාණයක් ලබා ගැනීමට අද ඇති පහසුම ක්‍රමය වන්නේ, පැරණි යුද්ධ සමයේ මෙන්ම ගෙවත්තේ යමක් සිටුවාගත හොත් පමණි

පැරණි ගෙවතුවල පලතුරු, අල, බෝග, එළවළු වර්ග ස්වල්ප වශයෙන් හෝ වගාකර තිබින. මේ මගින් ගෙදරට එදිනෙදා අවශ්‍ය ආහාර බෝග පහසුවෙන් සපයා ගැණිමට හැකිවිය. එම ගෙවතු වගාවෙන් ලද හැකි ද්‍රව්‍ය නාමාවලිය දෙස මදක් විමසිලිවත්ව බැලීමෙන්, අද අප විද්‍යානුකූලව පවසන සමබල අහරට අඩංගු සැම සංඝටක්කම අඩංගු බව පෙනෙන්නට ඇත. මේ න්‍යාය අනුව සමබල ආහාරක අඩංගු විය යුතු ද්‍රව්‍ය අතරින් සියල්ලම පාහේ ගෙවතු වගාවෙන් ලබාගත හැකි බැව් පෙනෙන්නට ඇත.

මේ නිසාම, කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අංශය, 'ගෙවතු වගාව' නවජීවනයකින් යුතුව පුළුල් පදනමක් මත ක්‍රියාත්මක කිරිමට අදහස් කර ඇත. මේ සඳහා අවශ්‍ය යෙදවුම් හා සේවා සැපයුම් වන බීජ හා රෝපන ද්‍රව්‍ය, පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය ගෙවතු වගාකරුවන්ට පහසුවන අයුරින් ලබා ගැනීමට පහසුකම් සපයා ඇත., උපදෙස් හා වගාවට අවශ්‍ය යෙදවුම් ඔබ පළාතේ වගා නිලධාරීන්ගෙන් ලබාගත හැකි අතර, ගෙවතු වගා පිළිබඳව අවශ්‍ය දැනුම ලබාදීමට පුහුණු පංති පැවැත්වීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය මඟින් සංවිධානය කර ඇත. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පළාතේ සහකාර ක ෂිකර්ම අධ්‍යක්ෂ හෝ කෘෂිකර්ම උපදේශක වෙතින් ලබාගන්න.

උනන්දුව හා උත්සාහය ඇත්නම් ඔබේ ගෙවත්ත ද පැරණි ගෙවතුවල මෙන් විවිධ බෝග වර්ග වවා ගැනීමට හැකියාව ඇත. එමගින් වාසි හා බොහෝ ප්‍රයෝජන අත්වේ. වගාවට මහන්සි වන නිසා ශාරීරික ව්‍යායාමය මෙන්ම තමා වවාගත් ද්‍රව්‍ය අපූරුවට වැඩෙත්ම ඉන් ගෙදරට මෙන්ම ගෙවත්තට ද අමුතු සිරියාවක් ලැබේ. ඒ නිසාම තම සිතතුල හටගන්නා ප්‍රීති සුභෝධය නිසා චිත්ත ප්‍රීතිය ලබනු ඇත. ඊටත් අමතරව එමගින් මුදල් ඉතිරිවන විට චිත්ත ප්‍රීතියත්, මානසික තෘප්තියත් ලැබිය හැක.

ගෙවතු වගාව අඩාලවීමට තුඩු දුන් බාධක බෙහෙවින් දුන් ඉවත් කර ඇත. අවශ්‍ය යෙදවුම්–සැපයුම් හා සේවා පහසුවෙන් ලබා ගැනීමට කටයුතු සලසා ඇත. එමසැම එකම වහලක් යටදී ගොවිජන සේවා කාර්යාලයෙන් ලබා දීමට විධි විධාන සලසා ඇති අතර, අපි අපේ රටේ '' අල්ලක් වවා මල්ලක් පිරවීමේ '' මූලිකයන් ව රට ජාතියට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීමට අධිෂ්ඨානයෙන් යුතුව ගෙවතු වවමු.

**National Digitization Project**

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : 2018/01/09
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N. S. Karunarathna

Signature : [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : Saumya Upamalika

Signature : [signature]

Date : 2018/01/09

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*